# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 1797/7 – 2013 පෙබරවාරි 12 වැනි අඟහරුවාදා – 2013.02.13

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

# I වැනි කොටස: (I) වැනි ඡේදය – සාමාන්‍ය

## ආණ්ඩුවේ නිවේදන

මගේ අංකය: IR/22/80/2009.

**ලංකාවේ ව්‍යවස්ථාපිත අණපනත්වල 131 වන පරිච්ඡේදය (1956 ප්‍රතිශෝධිත මුද්‍රණය) වන කාර්මික ආරාවුල් පනත**

4(1) වන වගන්තිය යටතේ නියෝගය

මෙම නියෝගය අනුබද්ධිත කම්කරු කොමසාරිස්වරයාගේ ප්‍රකාශනයේ නියම කර දක්වා ඇති කාරණය පිළිබඳව–

එස්. රාමසිංහ මහතා, 'නලගම ගෙදර', හැඩවින්න, මාමඩල, අම්බලන්ගොඩ.

සහ

ශ්‍රී ලංකා මහවැලි අධිකාරිය, අංක 500, ටී. බී. ජයා මාවත, කොළඹ 10.

අතර කාර්මික ආරාවුලක් පවතින හෙයින්ද,

කම්කරු හා කම්කරු සබඳතා අමාත්‍ය, ගාමිණී ලොකුගේ වන මම 1957 අංක 14 හා 1957 අංක 62 හා 1962 අංක 04 හා 1968 අංක 39 (1968 අංක 37 දරන කාර්මික ආරාවුල (විශේෂ ප්‍රතිපාදන) පනත සමග කියවා) දරන පනත් වලින් සංශෝධිත වූ, ලංකාවේ ව්‍යවස්ථාපිත අණපනත්වල 131 වන පරිච්ඡේදය (1956 ප්‍රතිශෝධිත මුද්‍රණය) වන කාර්මික ආරාවුල් පනතේ 4(1) වන වගන්තියෙන් මා වෙත පැවරී ඇති බලතල අනුව, එකී ආරාවුල බේරුම් කිරීමෙන් සමථයකට පත් කිරීම සඳහා බේරුම්කරු වශයෙන්

දිවුලපිටිය, මාපලන්ගෙදර, කේ. එම්. සරත්චන්ද්‍ර මහතා පත් කර ඔහු වෙත මෙයින් යොමු කරනු ලැබේ.

**ගාමිණී ලොකුගේ,**
කම්කරු හා කම්කරු සබඳතා අමාත්‍ය.

2013 ජනවාරි මස 18 වැනි දින,
කොළඹ දී ය.

මගේ අංකය: IR/22/80/2009.

**ලංකාවේ ව්‍යවස්ථාපිත අණපනත්වල 131 අධිකාරිය වන කාර්මික ආරාවුල් පනත (1956 ප්‍රතිශෝධිත මුද්‍රණය)**

එස්. රාමසිංහ මහතා, 'නලගම ගෙදර', හැඩවිත්ත, මාමඩල, අම්බලන්ගොඩ.

සහ

ශ්‍රී ලංකා මහවැලි අධිකාරිය, අංක 500, ටී. බී. ජයා මාවත, කොළඹ 10.

**ඉහත සඳහන් පාර්ශ්වයන් අතර ඇති කාර්මික ආරාවුලට හේතු වී පවත්නා කාරණය වනුයේ,**

ශ්‍රී ලංකා මහවැලි අධිකාරියේ සේවයේ නියුතු එස්. රාමසිංහ මහතාට 2007 ජනවාරි මාසයේ සිට 2008 අගෝස්තු මාසය දක්වා කාල සීමාව සඳහා ඉටු කරන ලද අමතර රාජකාරි වෙනුවෙන් හිමිවිය යුතු දිරි දීමනාව ලබා නොදීම යුක්තිසහගතද යන්න හා එසේ නොවන්නේ නම් ඔහුට හිමි විය යුතු සහන මොනවාද යන්න පිළිබඳව වේ.

**වී බී. පී. කේ. වීරසිංහ,**
කම්කරු කොමසාරිස්.

2013 ජනවාරි මස 07 දින,
කොළඹ, කම්කරු කොමසාරිස් තැනගේ
කාර්යාලයේදී දින යොදන ලදී.

03 - 77

---

මගේ යොමු අංකය: IR/13/80/2011.

**ලංකාවේ ව්‍යවස්ථාපිත අණපනත්වල 131 වන පරිච්ඡේදය (1956 ප්‍රතිශෝධිත මුද්‍රණය) වන කාර්මික ආරාවුල් පනත**

4(1) වන වගන්තිය යටතේ නියෝගය

මෙම නියෝගය අනුබද්ධිත කම්කරු කොමසාරිස්වරයාගේ ප්‍රකාශනයේ නියම කර දක්වා ඇති කාරණය පිළිබඳව –

බී. ඒ. සුසිරිපාල මයා, අංක 71, ඉලුක්පිටිය, උණවටුන

සහ

ශ්‍රී ලංකා ගමනාගමන මණ්ඩලය, අංක. 200, කිරුළ පාර, කොළඹ 05.

අතර කාර්මික ආරාවුලක් පවතින හෙයින්ද,

කම්කරු හා කම්කරු සබඳතා අමාත්‍ය, ගාමිණී ලොකුගේ වන මම 1957 අංක 14 හා 1957 අංක 62 හා 1962 අංක 04 හා 1968 අංක 39 (1968 අංක 37 දරන කාර්මික ආරාවුල (විශේෂ ප්‍රතිපාදන) පනත සමග කියවා) දරන පනත් වලින් සංශෝධිත වූ, ලංකාවේ ව්‍යවස්ථාපිත අණපනත්වල 131 වන පරිච්ඡේදය (1956 ප්‍රතිශෝධිත මුද්‍රණය) වන කාර්මික ආරාවුල් පනතේ 4(1) වන වගන්තියෙන් මා වෙත පැවරී ඇති බලතල අනුව, එකී ආරාවුල බේරුම් කිරීමෙන් සමථයකට පත් කිරීම සඳහා බේරුම්කරු වශයෙන්

පිළියන්දල, කැස්බෑව, සර්වෝදය මාවත, අංක. 13/30 හි සරත් ලියනගේ මහතා පත් කර ඔහු වෙත මෙයින් යොමු කරනු ලැබේ.

**ගාමිණී ලොකුගේ,**
කම්කරු හා කම්කරු සබඳතා අමාත්‍ය.

2013 ජනවාරි මස 18 වැනි දින,
කොළඹ දී ය.

මගේ යොමු අංකය: IR/13/21/2011.

**ලංකාවේ ව්‍යවස්ථාපිත අණපනත්වල 131 අධිකාරිය වන කාර්මික ආරාවුල් පනත (1956 ප්‍රතිශෝධිත මුද්‍රණය)**

බී. ඒ. සුසිරිපාල මයා, නො. 71, ඉලුක්පිටිය, උණවටුන

සහ

ශ්‍රී ලංකා ගමනාගමන මණ්ඩලය, අංක. 200, කිරුළ පාර, කොළඹ 05.

**ඉහත සඳහන් පාර්ශවයන් අතර ඇති කාර්මික ආරාවුලට හේතු වී පවත්නා කාරණය වනුයේ,**

ශ්‍රී ලංකා ගමනාගමන මණ්ඩලයේ ප්‍රාදේශීය වැඩපලෙහි වැඩ මූලික (ෆෝමන්) ඍෂ ලෙස සේවයේ නියුතු බී. ජී. සුසිරිපාල මහතාට ශ්‍රීලං.ග.ම./සේමකො/විධා/2004(1) හා 2005.02.11 දිනැති ලිපිය අනුව ෂඩ් ශ්‍රේණියේ ඉංජිනේරුවරයෙකු ලෙසට උසස් වීම ලබා නොදීමෙන් ඔහුට යම් අගතියක් සිදුවී තිබේද ? යන්න පිළිබඳව වේ.

**වී බී. පී. කේ. වීරසිංහ,**
කම්කරු කොමසාරිස්.

2013 ජනවාරි මස 07 දින,
කොළඹ, කම්කරු කොමසාරිස් තැනගේ
කාර්යාලයේදී දින යොදන ලදී.

03 - 78

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.